Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023, මාර්තු 18, කොළඹ

## නෙස්ලේ ලංකා සමාගම, චක්‍ර සූත්‍ර සමාගමේ ‘Trash2Cash’ ව්‍යාපෘතිය සමඟ අත්වැල් බැඳගනියි

- ප්ලාස්ටික් හේතුවෙන් සිදුවන පරිසර දූෂණය අවම කිරීමට පියවර ගනිමින්, චක්‍රීය ආර්ථිකයක් වෙත සිය ගමන වේගවත් කරයි

ගෝලීය ප්‍රතිචක්‍රීයකරණ දිනය සමරමින්, නෙස්ලේ ලංකා සමාගම, අපද්‍රව්‍යවලින් තොර අනාගතයක් වෙනුවෙන් නවෝත්පාදන විසඳුම් සැපයීමෙහි නිරතව සිටින චක්‍ර සූත්‍ර ආයතනය සමඟ අත්වැල් බැඳගැනීමට පියවර ගෙන තිබේ. මේ සමඟ, චක්‍ර සූත්‍ර සමාගම හඳුන්වා දුන් ‘Trash2Cash’ ස්මාර්ට් ප්‍රතිචක්‍රීයකරණ බඳුන් (Smart Recycling Bins) සඳහා විෂබීජහරණය කළ පාන ඇසුරුම් (aseptic beverage cartons) ආශ්‍රිතව එකම සහකරු ලෙස නෙස්ලේ ලංකා සමාගම සහයෝගතාවකට එළඹ ඇත. ‘Trash2Cash’ යනු පාරිභෝගිකයින්ට තම ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැරකර ඒ වෙනුවට ලකුණු ලබාගැනීමට අවස්ථාව සලසන ව්‍යාපෘතියකි. මෙලෙස එක්රැස් කරගනු ලබන විෂබීජහරණය කළ පාන ඇසුරුම්, දේශීය ප්‍රතිචක්‍රීයකරණ සමාගමක්වන වන EcoMaximus සමාගම විසින් ප්‍රතිචක්‍රීයකරණය කර ලිපිද්‍රව්‍ය නිෂ්පාදන කරයි.

තම පළමු නියමු ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමෙන් පසු මෙම ‘Trash2Cash’ ස්මාර්ට් ප්‍රතිචක්‍රීයකරණ බඳුන් මේ වනවිට මෙරට ප්‍රකට සුපිරි වෙළෙඳසැල් ජාලයක ශාඛා 10ක ස්ථාපිත කර තිබේ. එනම්, යූනියන් පෙදෙස, ඩාර්ලි පාර, ඩුප්ලිකේෂන් පාර, තලාහේන, තලවතුගොඩ 2, මහරගම, කොහුවල 2, රත්තනපිටිය, මොරටුව K Zone සාප්පු සංකීර්ණය සහ ගොරකාන යන නගරවල පිහිටි එම සුපිරි වෙළෙඳසැල්වලය. “‘Trash2Cash’ ව්‍යාපෘතිය පළමුව ආරම්භ කෙරුණේ ප්ලාස්ටික් බෝතල් එකතු කිරීමේ නවමු වැඩපිළිවෙළක් විදිහටයි. නෙස්ලේ ලංකා සමාගම තමන්ගේ පාන ඇසුරුම් සඳහාත් ඒ හා සමාන විසඳුමක අවශ්‍යතාව ප්‍රකාශ කළ විට අපි බෙහෙවින් සතුටට පත්වුණා. මාස කිහිපයක අත්හදාබැලීම්වලින් අනතුරුව අපගේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ලකුණු පිරිනමමින් පාන ඇසුරුම් එක්රැස් කිරීමේ වැඩසටහනක් හඳුන්වාදීමට අපට හැකිවුණා. නෙස්ලේ ලංකා සමාගම වැනි අනාගතය ගැන සිතන සමාගමක් සමඟ එකට වැඩකිරීමට ලැබීම අපට විශාල ගෞරවයක්. ඉදිරියේදී තවත් සමාගම්වලට මෙම වැඩපිළිවෙළ සමඟ අත්වැල් බැඳගැනීමට ඉන් විශාල දිරිගැන්වීමක් ලැබෙනවා”, යනුවෙන් චක්‍ර සූත්‍ර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය හිමේෂ් ප්‍රනාන්දු මහතා පැවසුවේය.

ප්ලාස්ටික් හේතුවෙන් සිදුවන පරිසර දූෂණය අවම කිරීමට ඇති සිය කැපවීම පෙන්නුම් කරමින් නෙස්ලේ ලංකා සමාගම මීට ඉහතදී තම Ready-To-Drink නිෂ්පාදනවලට කඩදාසි බීම බට හඳුන්වාදුනි. එම ව්‍යාපෘතිය නෙස්ලේ මයිලෝ නිෂ්පාදනය හරහා ආරම්භ වූ අතර, මේ වනවිට නෙස්ලේ මයිලෝ Ready-To-Drink ඇසුරුම මුළුමනින්ම ප්‍රතිචක්‍රීයකරණ කළ හැක. මෙම හරිත පියවරත් සමඟ නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකාව තුළ විෂබීජහරණය කළ පාන ඇසුරුම් කාණ්ඩය තුළ චක්‍රීය ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් විවිධ පියවර ගණනාවක් ආරම්භ කර ඇත. ඊට අමතරව තම පාරිභෝගිකයින් අතර චර්යාත්මක වෙනස්කම් ඇති කිරීමට ද මුලපුරා තිබේ.

ඒ අතර, පිරිසැකසුම් සහ ඇසුරුම්කරණ විසඳුම් සමාගමක්වන Tetra Pak සමාගම හා එක්ව ශ්‍රී ලංකාවේ පළමුවරට විෂබීජහරණය කළ පාන ඇසුරුම් ප්‍රතිචක්‍රීයකරණ පහසුකමක් ස්ථාපිත කිරීමට පියවර ගැනීම කැපීපෙනේ. තව ද, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන හා එක්ව ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ සහ ප්‍රතිචක්‍රීයකරණ කිරීමේ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට ද සමාගම සහාය විය. චක්‍ර සූත්‍ර සමඟ එක්ව ආරම්භ කළ මෙම නවමු ව්‍යාපෘතිය ද චක්‍රීය ආර්ථිකයක් කරා නෙස්ලේ ලංකා සමාගම යන ගමනේ සුවිශේෂී සන්ධිස්ථානයකි.

"ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය මැඩලීමට අප ගන්නා ප්‍රයත්නය තුළ චක්‍ර සූත්‍ර වැනි සමාගමක් සමඟ සහයෝගීතාවකට එළඹීමට හැකිවීම අපට විශාල සතුටක්. 2021 වසරේදී නෙස්ලේ මයිලෝ Read-To-Drink පානය සමඟ කඩදාසි බීම බටයක් හඳුන්වාදීම හරහා විෂබීජහරණය කළ පාන ඇසුරුම් සඳහා චක්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමට අප ගත් වෑයම සාධනීය ප්‍රතිඵල පෙන්නුම් කරමින් තිබෙනවා. ඒ අනුව, අපගේ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ සහ ප්‍රතිචක්‍රීයකරණ පාර්ශ්වකරුවන් සමඟ මේ දක්වා අප පැමිණි ගමන්මඟ පිළිබඳව මා ආඩම්බර වෙනවා. අපගේ දැක්ම වන්නේ අපද්‍රව්‍යවලින් තොර අනාගතයක් බිහිකිරීමට සහාය වීම සහ අපගේ ඇසුරුම් කිසිවක් කසල අංගන සහ සාගරය වෙත නොයන පරිසරයක් බිහිකිරීමයි. ඒ වෙනුවෙන් අපට ගත හැකි සියලුම පියවර ගනිමින්, පිවිතුරු සහ හරිත ශ්‍රී ලංකාවක් වෙනුවෙන් අපි ඇපකැපවෙනවා", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කිරි ආහාර අංශයේ අධ්‍යක්ෂ රුවන් වැලිකල මහතා ප්‍රකාශ කළේය.

'වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ' අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, ඉහළ ගුණාත්මකබවින් යුතු සිය ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත. 1906 වසරේ ශ්‍රී ලංකාව තුළ සිය මෙහෙයුම් ආරම්භ කළ නෙස්ලේ ලංකා සමාගම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට බද්ධ වී ඇත. එමෙන්ම 24,000කට වැඩි ශ්‍රී ලාංකික කිරි සහ පොල් ගොවීන් මෙන්ම ගෙවතු වගාකරුවන්ගේ ජීවනෝපාය සංවර්ධනයට දායකවන නෙස්ලේ ලංකා සමාගමේ ඍජු රැකියා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව 800 ඉක්මවයි. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් කර්මාන්තශාලාවේ දැඩි සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි. විටමින්වලින් සරුකර ඇති මයිලෝ නිපදවනු ලබන්නේ නැවුම් එළකිරි, මෝල්ට් සාරය සහ උසස්  තත්ත්වයේ කෝකෝවා භාවිත කරමිනි. නෙස්ලේ ලංකා සමාගමේ ජනප්‍රියතම සන්නාමයක්වන නෙස්ලේ මයිලෝ, විෂබීජහරණය කළ පාන ඇසුරුම් සඳහා චක්‍රීය ආර්ථිකයක් බිහිකිරීම වෙනුවෙන් හරිත පියවර ගණනාවකට මුලපුරා තිබේ.

**ඡායාරූපය:** නෙස්ලේ ලංකා ප්‍රසම්පාදන අංශ ප්‍රධානී සසංක ජයදාස මහතා, නෙස්ලේ ලංකා ඉල්ලුම් සහ සැපයුම් සැලසුම් අංශ ප්‍රධානී කාංචන ප්‍රනාන්දු මහතා, EcoMaximus නිර්මාතෘ තුසිත රණසිංහ මහතා, Tetra Pak හි ශ්‍රී ලංකා, දකුණු ආසියානු කලාප ව්‍යාපාර සංවර්ධන කළමනාකරු ෂැනොන් ප්‍රනාන්දු මහතා, නෙස්ලේ ලංකා කිරි ආහාර අංශයේ අධ්‍යක්ෂ රුවන් වැලිකල මහතා, චක්‍ර සූත්‍ර නිර්මාතෘ සහ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය හිමේෂ් ප්‍රනාන්දු මහතා, නෙස්ලේ ලංකා විකුණුම් අංශ අධ්‍යක්ෂ ජගත් වෙදගේ මහතා, නෙස්ලේ ලංකා සන්නිවේදන අංශ සහකාර අධ්‍යක්ෂිකා රඩිනි ද කොස්තා මහත්මිය, චක්‍ර සූත්‍ර හි මූල්‍ය අංශ ප්‍රධානී දර්ශන ගුණසේකර මහතා සහ චක්‍ර සූත්‍ර හි ඩිජිටල් අංශ ප්‍රධානී සසංක බණ්ඩාර මහතා

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |